# මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ග්‍රාමීය ජනතාවට දක්වන සමාජීය හා සංස්කෘතික බලපෑම පිළිබඳව මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

ජී.ජේ.එම්.එස්. ජයසිංහ[1]

ප්‍රමුඛ පදඃ එල්ලංගා, වාරි, සංස්කෘතික, සමාජය

## හැඳින්වීම

කෘෂිකර්මාන්තය ප්‍රධාන ජීවනෝපාය කරගත් අතීත ලාංකිකයන් ජලය සමඟින් ඉතා සමීප සබඳතාවයක් පැවැත්වූ අතර, ඒ නිසාම මනා කළමනාකරණයකි යුතු වාරිමාර්ග පද්ධතියකට ද හිමිකම් කියන ලදී. මෙහිදී හඳුනාගත හැකි විශිෂ්ටතම මානව නිර්මාණය වන්නේ වැවයි. වර්ෂා ජලය ගබඩා කර ගැනීම සඳහා නිර්මාණය වූ වැව් විශාල ප්‍රමාණයක් වියළි කලාපය පුරා ව්‍යාප්තව ඇත. මහ වැව් මෙන්ම කුඩා වැව් හෙවත් ග්‍රාමීය වැව් ගණනාවකින් සැදුම් ලත් මෙම ජලය කළමනාකරණ පද්ධතියක් හුදෙකලා වූවක් නොවන අතර එකිනෙකට සම්බන්ධව පොකුරු වශයෙන් පවතී. අතීතයේ සිටම අප රට තුළ ජල කළමනාකරණ මූලධර්ම මනාව ප්‍රායෝගිකව ක්‍රියාත්මක වුණු බවට එල්ලංගා පද්ධතිය මනාව සාක්ෂි සපයයි. වැසි ජලය කළමනාකරණය කරමින් සමස්ත ජීවයේම අවශ්‍යතාවය සැපයීම සඳහා අප එල්ලංගාවේින් සිදුවූ කාර්ය විශිෂ්ට වේ. සාම්ප්‍රදායික වැව හා අතර ගොඩනැගුණු සම්බන්ධතාවයේ යථා ස්වරූපය පිළිබඳ අධ්‍යයනය කිරීම මෙකී පර්යේෂණය අරමුණ වේ. මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ග්‍රාමීය ප්‍රජාවන්ගේ සමාජ ව්‍යුහය, සංස්කෘතික භාවිතයන් සහ ජීවනෝපායන් හැඩගස්වා ඇත්තේ කෙබඳුද? යන්න මූලික ගැටලුව ලෙස ගැනේ.

## ක්‍රමවේදය

මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ආශ්‍රිත ප්‍රදේශය ඉලක්ක කොටගෙන ක්ෂේත්‍ර නිරීක්ෂණ ක්‍රමවේදය යටතේ කේවල අධ්‍යයනයක් ලෙසින් මෙම පර්යේෂණ සිදු කරන ලදී. සම්මුඛ සාකච්ඡා පැවැත්වීම මගින් එල්ලංගා පද්ධතිය ග්‍රාමීය ජනතාවට දක්වන සාමාජීය හා සංස්කෘතික බලපෑම පිළිබඳ දත්ත රැස් කර ගන්නා ලදී.

---

[1] පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයන අංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
swarnamalijayasinhe@gmail.com

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

පෙර රජ දවස පැවැති එල්ලංගා පද්ධති ඒ ආශ්‍රිතව ඇති තෙත්බිම් ඇතුළු ගෝලීය වටිනාකමක් සහිත ස්වභාවික සම්පත් වලින් අනූන වූත්, ඊට සුවිශේෂ වූ වටිනාකමක් එක් කරන ලද ශාක සහ සත්ත්ව විශේෂ වලින් පොහොසත් වූත් ඒ හා ජීවිතය බැඳී ප්‍රජාවන්ගෙන් සමන්විත වූත් අපූර්ව පද්ධතියක් විය. උතුරු මැද පළාතේ අනුරාධපුර දිස්ත්‍රික්කයේ මිහින්තලේ පාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් නාමල් වැව 579 ග්‍රාම නිලධාරි වසම, වෙල්ලාරගම 580 ග්‍රාම නිලධාරි වසම හා මරදන්කල්ල 581 ග්‍රාම නිලධාරි වසම් තුළ පිහිටා ඇති මහකිරින්දේගම එල්ලංගා වැව් ගම්මාන පද්ධතිය ඉහත සඳහන් ලක්ෂණවලින් පොහොසත් ය.

මහකිරින්දේගම එල්ලංගා තුළ වාරි පද්ධති වැව් 14කින් ( රූපය 1) සමන්විත වේ. මහකිරින්දේගම, කුඩාකිරින්දේ ගම, කටුකැලියාව, වැල්ලමොරාන, ඇතාපැටියාව වැව, පුංචිකුලම වැව, මිරිස් කටුකැලියාව වැව, ඇලප්පන්කුලම්, සියඹලා වැව, කටුපොත වැව, කඳුපාගම වැව, කුඹහා වැව, අලුත් වැව හෙවත් කඳුබිඳු වැව, කඳුබිඳුණු වැව යන වැව් වලින් මහ කිරින්දේගම වැව පෝෂණය වේ.




රූපය 1: වැව් 14කින් සමන්විත මහකිරින්දේගම එල්ලංගා වැව් පද්ධතිය දක්වන සිතියම

මහකිරින්දේගම එල්ලංගා පද්ධති ග්‍රාමීය ජනතාවට දක්වන සමාජීය බලපෑම කෙරෙහි කොතරම් බලපා ඇති දැයි යන්න සොයා බැලීමේදී පෙනීයන්නේ වැව් පද්ධතිය මගින් ලැබෙන ආර්ථික දියුණුව හේතු කොටගෙන සාමාජීය වශයෙන් ඉහළ තත්ත්වයක් දක්නට ලැබේ. මෙම මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ආශ්‍රිත ගම්මාන තුල ග්‍රාම සංවර්ධන සමිති,සර්වෝදය සමිති මෙන්ම වාරි පද්ධතියට අයත් ගොවි සමිති ඉතා වැදගත් වේ. මහකිරින්දේගම එල්ලංගා පද්ධති ආශ්‍රිත වාරි පද්ධතියට අයත් ගොවි සංවිධාන අතර මහානාග, සමගි, වැල්ලමොරාන,

පුබුදු, සමෘද්ධි හා ධාතුසේන ආදී ගොවි සංවිධාන හඳුනාගත හැකිය. මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය තුළ මධ්‍ය , කුඩා හා ඉතා කුඩා වැව් දැකගත හැකි අතර ඒවායේ ජල කළමනාකරණ කටයුතු වාරිමාර්ග හා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මගින් පවත්වාගෙන යනු ලැබේ. ප්‍රධාන වශයෙන් වී වගාවටත් අනෙක් ගොඩ බෝග වගාවන් සඳහා සහ ගෘහශ්‍රිත පරිභෝජනයටත් සත්ව පාලන සහ ධීවර කටයුතු සඳහාත් මෙම වැව් පද්ධති සහ ජලය විශාල ලෙස දැනුදු ප්‍රයෝජනයට ගනු ලැබේ.

ආහාර නිෂ්පාදනය සඳහා කුඹුරු, ගෙවතු, හේන, වැව, වනාන්තර සහ කට්ටකාඩුව වැනි ස්ථාන යොදා ගනී. මිනිසුන් තම ජීවනෝපාය සඳහා මෙම සම්පත් මත යැපෙන අතර විවිධ වර්ගයේ බෝග නිෂ්පාදනය කරනු ලබයි. එසේම ආහාර හා බෙහෙත් හා අනෙකුත් අවශ්‍යතාවයන් සඳහා කටුපොත කන්ද අවට කලාපයේ ඇති වනාන්තර මත යැපීම ද බහුලව දැකිය හැකිය. තවද බෝග වගා කිරීම හා සත්ව පාලනය ඉහළ ජෛව විවිධත්වයක් ඇති කිරීමට දායක වී ඇත. එසේම ගොවිතැන සඳහා සාම්ප්‍රදායික වී වර්ග යොදා ගැනීම වැදගත් වේ. වැසි ජලය රඳවා ගැනීමට භූමිය කළමනාකරණය හා එම ජලය ක්‍රමිකව ගොවිබිම් වෙත මුදාහැරීමට භූමිය නිර්මාණය කර ඇති ආකාරයත් ආදියත් දේශීය දැනුම හා තාක්ෂණය නිරූපණය කරයි.

තවද ඇදහිලි හා විශ්වාස සහ චාරිත්‍ර වාරිත්‍ර ආදී සංස්කෘතික ලක්ෂණයන් මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය ආශ්‍රිතව හඳුනාගත හැකිය. වැව් ගම්වාසින්ගෙන් බහුතරයක් තම ආගමට අමතරව දෙවිවරු ගණනාවක් අදහයි. ඒ අතර පුල්ලෙයාර්, අයියනායක, විෂ්ණු දෙවියන්, පත්තිනි මෑණියෝ වෙති. මෙවැනි විවිධ දෙවිවරුන් හා බැඳුණු විශ්වාස නිසා වැවට අවැඩක් වන දේ කිරීමට මොවුන් බිය වෙති. වැව තම ජීවිතයේ කොටසක් සේ සළකති. වැව් තාවුල්ලේ ඇති විශාල ගසක් තෝරා ගෙන දේව ඇදහිල්ලට යොදා ගැනීම වැනි දේ තුළින් වැව ආශ්‍රිත පරිසර පද්ධතිය සුරැකීම කෙරෙහි නිරාසයෙන්ම අතීතයේ සිටම අද දක්වාම ගම්වාසීන්ට හැඟීමක් ඇතිව තිබේ. විවිධ ඇදහිලි ඔස්සේ ඔවුන්ගේ ජීවිතවල සරුසාර බවට හා වැවේ සමෘද්ධියට සිදු කෙරෙන සියලුම පුද පූජා ගමේ ප්‍රජාවට මංගල කාරණා බවට පත්ව ඇත්තේ නිරාසයෙනි. එම නිසාම වැව පාදක කරගත් රාජකාරීමය පුද පූජා වැවේ මංගල්ලේ ලෙස හැඳින්වීමට මහ කිරින්දේගම එල්ලංගා පද්ධතිය ආශ්‍රිත වැව් ගම්මාන වාසීන් පුරුදු වී සිටිති.

වැව සමග අලුත් අවුරුද්දට ගනුදෙනු කළ අපේ ආදි මුතුන් මිත්තන් උපතේ සිට මරණය දක්වා ජීවිතයේ වැදගත් වූ විවිධ අවස්ථාවන්හි වැව සමග සුහද ගනුදෙනුවක බැඳුණි. උපන් බිළිදා ස්නානය කරවීමට වැවට යන ඔවුන් ඉන් අනතුරුව වැව් භාර දීමේ චාරිත්‍ර සිදු කරන්නේ අලුත් පරම්පරාවේ සාමාජිකයට වැවත් එහා බැඳුණු සංස්කෘතිය පවරා දීමටය. නමුදු මරණයක් වූ කලී මලමිනිය

වැකන්ද මතයෙන් රැගෙන නොයාමට ඔවුන් වගබලා ගන්නා ලදී. ඒ මන්ද යත් එය වැවටත්, එහි ජලයටත් කරන අගෞරවයක් ලෙස සලකන බැවිනි.

## සමාලෝචනය

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ වැව් ගම්මාන යනු විවිධ වූ ස්වභාවික හා කෘතිම සංඝටක හා භූ විෂමතාවය සහ පිහිටීම අනුව නිසි දැනුමක් පරිහරණය කරමින් සංරක්ෂණය කරන ඒකකයක් බවයි. මේ නඩත්තු කිරීම සිදුකරනුයේ මිනිසා මුල් කොට ගෙනය. මානව වර්ගයාගේත් සමස්ත ජීවයේම පැවැත්ම උදෙසා අහස් දී රැස් කර එය මනාව කළමනාකරණය කරමින් හා සංරක්ෂණය කරමින් මතු පරපුරටත් දායාද කර දෙන්නට පැරණි වාපි වාරි ශිෂ්ටාචාරය සමත් වී තිබී ඇත. මේ ආකාරයට ගත් කළ අතීතයේ පටන්ම ශ්‍රී ලංකාව තුළ ඉතා දියුණු සුරක්ෂිත ජල කළමනාකරන ක්‍රමවේදයන් ක්‍රියාත්මක වූ බව ඒ හා බැඳුණු සමාජීය හා ප්‍රෞඪ සංස්කෘතියකින්ද පෝෂණය වූ එල්ලංගා පද්ධති මගින් නිහඬව සාක්ෂි දරයි.

## ආශ්‍රිත මූලාශ්‍රය


තෙන්නකොන්, එම්. යූ. ඒ. (2005). ***වියළි කලාපීය පරිසරානුගත සංවර්ධනයක් සඳහා එල්ලංගාව***. ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

තෙන්නකොන්, එම්.යූ.ඒ. (2012). ***එල්ලංගානුගත වැව් වලට ප්‍රවේශයක්.*** ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ.


## සම්මුඛ සාකච්ඡා


සෙනරත්, ශිරාණි. (2025). මහකිරින්දේගම එල්ලංගා පද්ධතිය පිළිබඳව. ජී.ජේ.එම්.එස් ජයසිංහ, 2025/10/20